041

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි වැඩසටහන-පස්වන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
STU5531/STU5518 - සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.11.27 වේලාව - පෙ.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සෞන්දර්ය යන්නට ඔබ විසින් දෙනු ලබන අර්ථකථනය කුමක් ද? හේතු සහිතව පැහැදිලි කරන්න.

02. සෞන්දර්ය අධ්‍යාපනය මගින් ශිෂ්‍යයා ලබන සුවිශේෂී ප්‍රතිලාභ පහක් (05) දක්වන්න.

03. සෞන්දර්ය අධ්‍යාපනය වර්තමාන පාසල් පන්තිකාමරයට කොතෙක් දුරට අවශ්‍ය සාධකයක් ද යන්න සුදුසු උදාහරණ දෙකක් (02) ඇසුරින් පැහැදිළි කරන්න.

04. විධිමත් අධ්‍යාපනය තුළ සෞන්දර්ය විෂයයන් ඉගැන්වීමේ දී ගුරුවරයා විසින් පුහුණු කළයුතු කුසලතා මොනවා ද? කරුණු තුනක් (03) ඔස්සේ පහදන්න.

05. ශිෂ්‍යයාගේ සෞන්දර්ය හැකියා සවිබල ගැන්වීම සඳහා ඉගැන්වීමේ දී ගුරුවරයාට යොදාගත හැකි නිර්මාණාත්මක උපක්‍රම හතරක් (04) දක්වන්න.

06. භාවමය බුද්ධිය යනු කුමක්දැයි ඔබේ වචනයෙන් විස්තර කරන්න.

07. පන්තිකාමර ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයන්ගේ භාවමය බුද්ධිය සංවර්ධනය කිරීමෙහි ලා යොදාගත හැකි ක්‍රමවේද තුනක් (03) දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න.

08. ප්‍රාථමික අවධියේ පන්තිකාමර තුළ සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු පහක් (05) දක්වන්න.

(ලකුණු 05 X 08 = 40)

## 2 වන කොටස

09\. (I) මනෝවිද්‍යාඥයින් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද අදහස් සැලකිල්ලට ගනිමින් "බුද්ධිය" යන්න විස්තර කරන්න. (ලකුණු 04)

(II) බහුවිධ බුද්ධි න්‍යාය නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකුට කොතෙක්දුරට වැදගත් වන්නේ ද? සුදුසු උදාහරණ දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 06)

(III) බහුවිධ බුද්ධි න්‍යායට අදාල බුද්ධි වර්ගවලින් එක් වර්ගයක් තෝරාගෙන එම බුද්ධි වර්ගය ශිෂ්‍යයා තුළ සංවර්ධනය කිරීම සඳහා ගුරුවරයෙකු වශයෙන් ඔබට පන්ති කාමරය තුළ සිදුකළ හැකි නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් පියවර සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

10\. (I) සෞන්දර්ය සාක්ෂරතාව යන්න ඔබේ වචනයෙන් ලියන්න. (ලකුණු 04)

(II) ශිෂ්‍යයා තුළ සෞන්දර්ය සාක්ෂරතාව ඇති කිරීමෙහි ලා ගුරුවරුන්ගේ කාර්යභාරය කරුණු තුනක් (03) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(III) "සෑම ගුරුවරයෙකු ම සෞන්දර්ය සාක්ෂරතාවයෙන් යුක්ත විය යුතුය." මෙම ප්‍රකාශය සුදුසු උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11\. (I) ප්‍රාථමික පන්තිකාමරය සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී ගුරුවරයා විසින් සැළකිලිමත් වියයුතු කරුණු හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(II) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නාට්‍ය හා රංගකලා විෂය සඳහා සෞන්දර්යාත්මක හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සිදු කිරීමට අනෙකුත් සෞන්දර්ය විෂයයන්ගෙන් ලැබෙන දායකත්වය උදාහරණ දෙකක් (02) ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 06)

(III) ද්විතීයික පන්තිකාමරයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල උපයෝගීතාව නාට්‍ය හා රංගකලා විෂයට අදාළ පාඩමක් ඇසුරින් උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (I) සෞන්දර්ය විෂයන්ගෙන් ශිෂ්‍යයා ලබන ප්‍රතිලාභ ශාරීරික, චිත්තවේගීය හා සමාජයීය වශයෙන් ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(II) 2006 වසරේ දී යුනෙස්කෝව විසින් හඳුන්වාදුන් සෞන්දර්ය අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු හතර **(04)** දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(III) එම අරමුණු වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ කොතෙක් දුරට ප්‍රායෝගික වී ඇත්ද යන්න උදාහරණ සපයමින් විචාරාත්මකව පහදන්න. (ලකුණු 10)

13. (I) භාවමය බුද්ධියේ සිව්වැදෑරුම් සංරචක නම් කරන්න. (ලකුණු 04)

(II) භාවමය බුද්ධිය සහිත පුද්ගලයකුගේ විශේෂ ලක්ෂණ හතරක් **(04)** නම් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06)

(III) චිත්තවේගී කළමනාකරණය පුද්ගල ජීවිතය සාර්ථක වීමෙහි ලා වැදගත් වන්නේ ඇයිදැයි සුදුසු නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.